# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1802/19 - 2013 මාර්තු මස 22 වැනි සිකුරාදා - 2013.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන අජිත් අනුර තලංගමආරච්චි මහතා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී හැන්නැදිගේ රසික ප්‍රියංග පීරිස් වන මම (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

රසික පීරිස්,
තේරීම්භාර නිලධාරී,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 13 වැනි දින,
කළුතර මැතිවරණ කාර්යාලයේ දී ය.

04 - 251

---

### දමන ප්‍රාදේශීය සභාවේ උපසභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

උප සභාපති, සභාපති ධූරයට පත්වීම හේතු කොට ගෙන දමන ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

උප සභාපති වන ජාගොඩ ආරච්චිගේ මංගල මහින්ද ගුණවර්ධන නම් වූ උප සභාපති අයත්වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ දමන ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනුර ප්‍රගීත් හෙට්ටිගමගේ මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

දමන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, වෙනුර ප්‍රගීත් හෙට්ටිගමගේ මහතා දමන ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

තිළිණ වික්‍රමරත්න,
තේරීම්භාර නිලධාරී,
දමන ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 13 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

04 - 252


1A - G 17456 — 360 (2013/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත**

10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම

**මහර ප්‍රාදේශීය සභාව**

මහර ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන උචිර සංකල්ප කස්තුරිආරච්චි මහතා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අතහැර ඇති බව මහර ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී පතිරාජ ආරච්චිල්ලාගේ සුනිල් සේනාරත්න වන මම (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

පී. ඒ. එස්. සේනාරත්න,
තේරීම්භාර නිලධාරී,
මහර ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 12 වැනි දින,
ගම්පහ මැතිවරණ කාර්යාලයේ දී ය.

04 - 253

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.